වැලිවෙට්ටිතුරෙයි නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 20 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වැලිවෙට්ටිතුරෙයි නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට පරිත්‍යාග වශයෙන් ලැබීතිබූ රු. 1,640,500 ක් වටිනා වාහන 06 ක් සභාවේ නමට අයිතිය පවරාගෙන නොතිබුණද, එවායේ වටිනාකම් ගිණුම්වලට ගෙනවිත් තිබීමෙන් මොටර් රථවල වටිනාකම් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන 02 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබීමෙන් වාහනවල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
-----------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) නගර සභා රෙගුලාසි පරිච්ඡේදය III වගන්තිය 54(2) | වරිපනම් බදු අයකිරීම් සම්බන්ධව ඒ ඒ කාල පරිච්ඡේදවල අයකිරීම් සිදුකර නොතිබුණි. |
| (ආ) නගර සභා ආඥා පනත වගන්තිය 44(2) | නගර සභාව ස්ථාපිත කර වර්ෂ 3 ක් ඇතුලත සභාවේ මාර්ග සහ පටුමග උපලේඛන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශකර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
මුදල් රෙගුලාසි 571 — රු. 15,890 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 19,831,328 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 8,899,309 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 10,932,019 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
--------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු 158,109 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 34,036 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රතිඵලය රු. 124,073 කින් වර්ධනය වීමක් පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
--------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 90,996,001 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 76,242,094 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 14,754,107 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය
------------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
--------------------------------------

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 800 | 767 | 4,782 |
| බදු කුලී | 4,680 | 14,159 | - |
| බලපත්‍ර ගාස්තු | 835 | 703 | - |
| වෙනත් ආදායම් | 47,476 | 46,650 | 27,388 |
| එකතුව | 53,791 | 62,279 | 32,170 |

2.4.2 වරිපනම් බදු

--------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වරිපනම් බදු සඳහා දේපළ නැවත තක්සේරු නොකිරීමෙන් වරිපනම් බදු අයවීම් අවම මට්ටමක තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 4,782,089 ක් විය.

2.4.3 කඩ කුලී

---------

පොළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 11 ක් සහ විවෘත ශාලාව බදු දී නොතිබීමෙන් නගර සභාවට ලැබියයුතු ආදායමක් අහිමිවී තිබුණි.

2.4.4 වෙනත් ආදායම්

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා සතු සුසාන භූමි 5 කින් බදු අයකර ගෙන නොතිබුණි.

(ආ) ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු රු. 14,382,843 ක මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මල්වත්තක් ඉදිකිරීම සඳහා 2013 ජුනි 28 දින සභා තීර්ණයක් මත ඉඩමක් ලබාගෙන තිබුණද, මෙම මල්වත්ත ඉදිකර නොතිබුණද, රු. 239,040 ක් බදු වශයෙන් ගෙවා තිබුණි. මෙය නිෂ්කාර්ය වැයක් බව නිරීක්ෂණය විය.

(ආ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 84 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 81 ක් වීමෙන් ඒ අනුව, සේවක පුරප්පාඩු 03 ක් විය. තවද සේවක අතිරික්ත 02 ක්ද පැවතුණි.

(ඇ) වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවැත්විය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

(ඈ) වට්ටෝරු ලේඛන අනුව ට්‍රැක්ටර් ට්‍රේලර් 08 ක ශේෂයන් දක්වා තිබුණද, භෞතිකව ට්‍රැක්ටර් ට්‍රේලර් 07 ක් පමණක් තිබුණි. මෙම ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3.2 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

සභාවට අයත් වාහන 03 ක් නිෂ්ක්‍රීයව තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

අයවැය ලේඛනයේ සඳහන් රු. 7,500,000 ක් වටිනා වැඩ යෝජනා 03 ක් ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි.

3.4 අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------
රැස්කරන අපද්‍රව්‍ය අවිධිමත් ආකාරයෙන් විවෘතව ගිණි තැබීම සිදු කරමින් පැවතුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
---------------------------------------
අයවැය පාලනය
-----------------
වියදම් ව්‍යුහය
---------------
අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 1,849 සිට රු. 3,197,565 දක්වා වියදම් විචලනයක් පැවතුනු බව විගණනයේදී නිරික්ෂණය විය.

5 පද්ධති හා පාලන
------------------
පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(අ) වාහන උපයෝජනය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් රැස්කිරීම
(ඈ) සුළු ණය හිමියෝ
(ඉ) විදුලි භාණ්ඩ ලේඛනය
(ඊ) තොග ලේඛනය
(උ) ඉඩම් විකුණුම් බදු ලේඛනය